# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1991 අංක 39 දරන සංචාරක සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 නොවැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 30 යි.  තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1991 අංක 39 දරන සංචාරික සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 26/89

**1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1991 අංක 39 දරන සංචාරික සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනතේ 83 වන වගන්තිය මෙයින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ :— (1968 අංක 14 දරන පනතේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "උපරිම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන වෙනුවට "උපරිම හෝ අවම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඇති විවිධ උපරිම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන වෙනුවට "විවිධ උපරිම හෝ අවම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ ඇති "ඉහල උපරිම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන වෙනුවට "ඉහල උපරිම හෝ ඉහල අවම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම වගන්තියේ පාර්ශ්ව සටහන ඉවත් කිරීමෙන් ඒ වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"සංචාරික සේවා සම්බන්ධයෙන් උපරිම හෝ අවම මිල ගණන් ආදිය නියම කරන සභාපතිවරයාගේ නියමය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (ඇ) ඡේදයේ ඇති "ඒ නියමයෙහි සඳහන් කරනු ලබන උපරිම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන වෙනුවට, "ඒ නියමයෙහි සඳහන් කරනු ලබන උපරිම සහ අවම මිල ගණන්, ගාස්තු ප්‍රමාණ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.)

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. (අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා

**ලබාගත හැකිය.**